දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/02-01-34/01/2017
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2017.06. 09

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

__බඳවා ගැනීම් පරිපාටි, තනතුරුවලට බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා ගැනීම.__

උක්ත කරුණ සම්බන්ධව ඔබේ අංක ED/5/67/26/01/27 හා 2017.05.31 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යාලගත හා ක්ෂේත්‍රගත බණ්ඩ 02 සේවා ගණයේ (MN-05-2016A) බඳවා ගැනීම් පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පරිපාටිය වෙබ් අඩවියේ පළ කර, ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව වැඩිදුරටත් දන්වමි.

අත්/කළේ ආර්.ඩී.පී.එස්.ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්

1. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව (මුල් පිටපත මේ සමග එවමි)
2. ආයතන අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය - (මුල් පිටපත මේ සමග එවමි)
3. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව - (මුල් පිටපත මේ සමග එවමි)

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත / කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ (MN-05-2016 A) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : පුරාවිද්‍යා යොමු අංකය : පුවි/1/1/බ.ගැ පරිපාටි (iv) දිනය : 2013.07.01

1.2 අමාත්‍යාංශය : අධ්‍යාපන යොමු අංකය : NH/1/8/2/28(VI) දිනය : 2013.07.24

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම යොමු අංකය : DMS/CO4/29-02 දිනය : 2010.11.23

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය : EST-3/RECRU/04/62/46 දිනය : 2012.02.27

1.5 වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය : NSCC/4/29/2-SR-1 දිනය : 2012.11.01

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය : PSC/EST/2/1/29/11/2013 දිනය : 2016.09.01

02. පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත්කිරීම් බලධරයා : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : කාර්යාල හා ක්ෂේත්‍රගත ඛණ්ඩ 2

3.2 ශ්‍රේණි : II ශ්‍රේණිය
I ශ්‍රේණිය.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

පුරාවිද්‍යා ආඥා පනතින් පැවරෙන කාර්යයන් මඟින් නිල නාමයන් විශේෂිත කොට පවරනු ලබන බලාත්මක කිරීමේ / නියාමනය කිරීමේ / විධිමත් කිරීමේ නෛතික කාර්යයන් විධායක නිලධරයන්ගේ අධීක්ෂණය යටතේ පැවරෙන්නාවූ ද බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනැමෙන උපාධි අධ්‍යාපන සුදුසුකම් අවශ්‍ය වන්නාවූ ද සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීම සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරේ ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : MN - 05 - 2016 A

5.2 වැටුප් පරිමාණය : රු. 34,605 – 10 x 660 – 11 x 755 – 15 x 930 – 63,460/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| II | 01 | 34,605/= |
| I | 12 | 41,960/= |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | ඒවාට පැවරෙන කාර්යයන් |
|---|---|---|
| 01. ප්‍රාදේශීය සංරක්ෂක | 09 | ස්වකීය පළාත තුළ පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ නියමිත වාර්තා සැපයීම, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම. |
| 02. ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු | 10 | ස්වකීය පළාත තුළ ඇති පුරාවිද්‍යා ස්මාරක හා භූමි නඩත්තු කිරීම, ඒ සඳහා යොදවා ඇති කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම හා නඩත්තු වැඩ අධීක්ෂණය කිරීම, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම. |
| 03. ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී | 09 | ස්වකීය පළාත තුළ ඇති පුරාවිද්‍යා කැණීම් හා කෞතුකාගාර කටයුතු සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම සහ නියමිත වාර්තා සැපයීම, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම. |
| 04. ප්‍රාදේශීය ගවේෂක | 09 | ස්වකීය පළාත තුළ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති චංචල හා නිශ්චල දේපල සොයා ගැනීම එම දේපල ලේඛනගත කිරීම, ඒවායේ පරිපාලනය සහ ගවේෂණ කටයුතු, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| | |
|---|---|
| ප්‍රාදේශීය සංරක්ෂක | 09 |
| ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු | 10 |
| ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී | 09 |
| ප්‍රාදේශීය ගවේෂක | 09 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය.

7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : II ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) ප්‍රාදේශීය ගවේෂක - පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුරාවිද්‍යාව පිළිබඳ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. හෝ සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සහිතව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

(ආ) ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී - පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුරාවිද්‍යාව / කෞතුකාගාර විද්‍යාව පිළිබඳව සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. හෝ සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සහිතව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

(ඇ) ප්‍රාදේශීය සංරක්ෂක - පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් වාස්තු විද්‍යාව හෝ වාස්තු විද්‍යා සංරක්ෂණය පිළිබඳ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පී ආයතනයේ පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

(ඈ) ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු - පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු / වාස්තු විද්‍යා / පුරාවිද්‍යාව පිළිබඳ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. හෝ සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සහිතව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නැත.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නැත.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 21

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව එක් එක් තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතා සනාථ කර ගැනීමෙන් පසු බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය :

| **විෂයයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 1. පුරාවිද්‍යාව | 100% | 40% |
| 2. ශ්‍රී ලංකාවේ ඉතිහාසය | 100% | 40% |

විභාග විෂය නිර්දේශය ඇමුණුම I හි දක්වා ඇත.

7.2.4.1.1 පවත්වන බලධරයා : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

7.2.4.2 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබාදෙනු නොලැබේ.)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීම සඳහා.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම් :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : II ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ අය සඳහා වූ අධ්‍යාපන සුදුසුකම්.

(i) ප්‍රාදේශීය ගවේෂක - පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුරාවිද්‍යාව විෂයයක් ලෙස සමත් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. හෝ සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සහිතව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

(ii) ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී - පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුරාවිද්‍යාව / කෞතුකාගාර විද්‍යාව විෂයයක් ලෙස සමත් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. හෝ සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සහිතව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

(iii) ප්‍රාදේශීය සංරක්ෂක - පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාස්තු විද්‍යාව/ වාස්තු විද්‍යා සංරක්ෂණය විෂයයක් ලෙස සමත් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

(iv) ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු - පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු / වාස්තු විද්‍යා / පුරාවිද්‍යාව විෂයයක් ලෙස සමත් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. හෝ සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සහිතව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

(ආ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ (MN-03) හා (MN-01) තනතුරුවල සේවයේ නියුතු පහත 7.3.2.3 හි සඳහන් පළපුරුද්ද සහිත නිලධාරීන් සඳහා වූ අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද : (අ) ඉහත 7:3:2:1 හි සඳහා අධ්‍යාපන සුදුසුකම් සහිත ආශ්‍රිත සේවා ගණය යටතේ වන පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය අයත් තනතුරක වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම.

(ආ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03) II ශ්‍රේණියේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හෝ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

එක් එක් තනතුරට අදාළව පළපුරුද්ද තිබිය යුතු තනතුරු පහත වගුවෙහි දක්වා ඇත.

| තනතුර | පළපුරුද්ද තිබිය යුතු තනතුරු |
|---|---|
| ප්‍රාදේශීය ගවේශක | ගවේෂණ නිලධාරී/ පුරාවිද්‍යා පර්යේෂණ සහකාර/ සංවර්ධන නිලධාරී |
| ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී | කැණීම් නිලධාරී/ කැණීම් හා කෞතුකාගාර නිලධාරී/ පුරාවිද්‍යා පර්යේෂණ සහකාර/ සංවර්ධන නිලධාරී |
| ප්‍රාදේශීය සංරක්ෂක | කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) / සැලසුම් ශිල්පී |
| ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු | වැඩබිම් කළමනාකරු/පුරාවිද්‍යා පර්යේෂණ සහකාර/ සංවර්ධන නිලධාරී/ කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) / සැලසුම් ශිල්පී |

මෙහි දී එක් එක් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ අවම වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඇ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ (MN-01) I ශ්‍රේණියේ වසර 02 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

එක් එක් තනතුරට අදාළව පළපුරුද්ද තිබිය යුතු තනතුරු පහත වගුවෙහි දක්වා ඇත.

| තනතුර | පළපුරුද්ද තිබිය යුතු තනතුරු |
|---|---|
| ප්‍රාදේශීය ගවේශක | ගවේශන සහකාර |
| ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී | කැණීම් සහකාර/ කැණීම් හා කෞතුකාගාර සහකාර |
| ප්‍රාදේශීය සංරක්ෂක | රසායනාගාර සහකාර/ රසායන සංරක්ෂණ සහකාර |
| ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු | නඩත්තු සහකාර |

7.3.2.4 කායික සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.5 වෙනත් :

I. පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.
II. තනතුරේ ස්ථිර කර තිබිය යුතුය.
III. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබිය යුතුය.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 හි දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය :

7.3.3.1 ලිඛිත විභාගය : ලිඛිත විභාගය සමත් අදාල සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව එක් එක් තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතා සනාථ කර ගැනීමෙන් පසු බඳවා ගනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. පුරාවිද්‍යාව | 100% | 40% |
| 2. ශ්‍රී ලංකාවේ ඉතිහාසය | 100% | 40% |

විභාග විෂය නිර්දේශය ඇමුණුම 1 හි දක්වා ඇත.

7.3.3.1.1. පවත්වන බලධරයා : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් හෝ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

හා / හෝ

7.3.3.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.3.3 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.3.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබාදෙනු නොලැබේ.)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : මූලික සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා.

7.3.3.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා :පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

7.3.4. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| **කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග** | **කාර්යක්ෂමතා කඩඉම් ඉක්මවා යන්නේ කොපමණ වසර ගණනක පසුව ද** | **කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව /වෙනත්** |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට පත්වී වසර 03 කින් | ලිඛිත පරීක්ෂණයක් විෂය නිර්දේශය ඇමුණුම 02 හි දැක් වේ. |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර 05කින් | ලිඛිත පරීක්ෂණයක් විෂය නිර්දේශය ඇමුණුම 03 හි දැක් වේ. |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ දී ලබා ගත යුතු යි. |
| 02. අනෙක් භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව නියමිත මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |

10. ශ්‍රේණි උසස් කිරීම්

10.1 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) ක් උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘතිපත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, එම පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

10.1.1.3 සංලක්ෂය :

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම : අදාළ නොවේ.

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් : අදාළ නොවේ.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය : අදාළ නොවේ.

11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ.

"සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුලත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

14. සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම : ඇමුණුම 04 හි දැක්වේ.

15. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන වලට අමතරව ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැතිව ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට සෑම නිලධාරියකුම යටත් වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ

සකස් කළේ :

අත්සන ..............................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :- එන්.ඒ. මුදිත [illegible] සහකාර අධ්‍යක්ෂ (පාලන) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

තනතුර :- ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, [illegible]

දිනය :- 2017 . 05 . 29

පරීක්ෂා කළේ :

අත්සන ..............................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

පී.ඒ.[illegible] [illegible]

නම :- අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ පන්තිය)

තනතුර :- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,

දිනය :- 2017 / [illegible] / [illegible]

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : මහාචාර්ය සෙනරත් දිසානායක

තනතුර : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

නිල මුද්‍රාව : කොළඹ 07

දිනය : 2017 / 05 / 29

---

යොමු අංකය : ED/5/67/26/01/27

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හි [illegible] සේවා ශ්‍රේණියේ

තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : ..............................

ලේකම්,

.............................. අමාත්‍යාංශය.

දිනය : 2017 . 05 . 31

නිල මුද්‍රාව : සුනිල් හෙට්ටිආරච්චි ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය "ඉසුරුපාය" බත්තරමුල්ල

---

යොමු අංකය : PSC/EST/2/1/29/11/2013

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හි තාක්ෂණ / කාර්යාලයීය කාණ්ඩ 2 සේවා තනතුර සඳහා වන — මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2016.09.01 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : [signature]

නම : එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

දිනය : 2017.06.07

නිල මුද්‍රාව : ..............................

**එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

ඇමුණුම 01

01. විභාගයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ තනතුරු සඳහා විවෘත හා සීමිත බඳවා ගැනීම් විභාගය.

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. පුරාවිද්‍යාව | පැය 02 | 100% | 40% |
| 2. ශ්‍රී ලංකා ඉතිහාසය | පැය 02 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.පුරාවිද්‍යාව | 1. ගවේෂණ හා කැණීම් කටයුතු මඟින් ලබාගන්නා ලද (භෞතික සාධක) පුරාවස්තු අධ්‍යයනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ අතීතය ගොඩනැගීමට අදාල කරුණු.<br>2. ගවේෂණ හා කැණීම් කටයුතු මඟින් සොයා ගන්නා පුරාවස්තු සංරක්ෂණය කර පවත්වාගෙන යාම (නඩත්තුව) හා ඒ පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීම හා සම්බන්ධිත කරුණු. |
| 2. ශ්‍රී ලංකා ඉතිහාසය | 1. ලිඛිත සාධක වංශ කථා හා අභිලේඛන තොරතුරු යනාදිය අධ්‍යයනය කිරීමෙන් අතීතය ගොඩනැංවීමට අදාළ කරුණු. |

සකස් කළේ :

අත්සන : ..............................

නම : එන්.ඒ. මුදිත විටලආරච්චි

තනතුර: සහකාර අධ්‍යක්ෂ (පාලන) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

දිනය : 2017 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.

පරීක්ෂා කළේ :

අත්සන : ..............................

නම : පී.ඒ.එස්.ඩබ්. බොරලැස්ස අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)

තනතුර : ශ්‍රී ලංකා පරිපාලන සේවය විශේෂ ශ්‍රේණිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

දිනය : ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..............................

තනතුර : මහාචාර්ය සෙනරත් දිසානායක පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

දිනය : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

නිල මුද්‍රාව : කොළඹ 07.

ඇමුණුම 02

01. විභාගයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයෙහි 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන කටයුතු | පැය 03 | 100% | 40% |
| 2. මුදල් රෙගුලාසි | පැය 03 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන කටයුතු | 1. ආයතන සංග්‍රහයේ VII, VIII, XII, XIV, XVIII, XXIII, XXVII, XXVIII, XXIX, XXX, XLVII, XLVIII පරිච්ඡේද<br>2. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති. |
| 2. මුදල් රෙගුලාසි | ඒකාබද්ධ අරමුදල වාර්ෂික ඇස්තමේන්තු සහ ප්‍රතිශෝධන ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්, ගණන්දීමේ නිලධාරීන්, ආදායම් ගිණුම්ගත කිරීම, ගෙවීම් කාර්ය පටිපාටි බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම, රජ්‍ය අරමුදල් භාරකාරත්වය, ගෙවීම් හා ලැබීම් සම්බරවූ ක්‍රියාවලිය, රජ්‍ය දේපල සුරක්ෂිතභාවය, භාණ්ඩ හා ගබඩා කාර්ය පටිපාටි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා කාර්ය පටිපාටි. |

සකස් කළේ :
අත්සන : ..................
නම : .................. එන්.ඩී. මුදිත විටලනගේ
තනතුර: .................. සහකාර අධ්‍යක්ෂ (පාලන) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
දිනය : 2017.. ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.

පරීක්ෂා කළේ :
අත්සන : ..................
නම : ..................
තනතුර: ..................
දිනය : ..2017.11.08..
පී.ඒ.එස්.එච්. ගොරලයේස
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ - 07.

අත්සන : ..................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..................
තනතුර : .................. මහාචාර්ය සෙනරත් දිසානායක
දිනය : 2017.. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව : .................. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ 07.

**ඇමුණුම 03**

01. විභාගයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයෙහි 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. දෙපාර්තමේන්තු රෙගුලාසි හා ක්ෂේත්‍ර පුරාවිද්‍යා මූලධර්ම | පැය 03 | 100% | 40% |
| 2. කළමනාකරණය | පැය 03 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. දෙපාර්තමේන්තු රෙගුලාසි හා ක්ෂේත්‍ර පුරාවිද්‍යා මූලධර්ම | 1. දෙපාර්තමේන්තු චක්‍රලේඛ, ස්ථාවර නියෝග, පුරාවිද්‍යා ආඥා පනත හා සංශෝධන, සංස්කෘතික දේපල පනත පිළිබඳ අවබෝධය.<br><br>2. ගවේෂණ හා කැණීම් මූලධර්ම, පුරාවිද්‍යා ආචාර ධර්ම පද්ධතිය, ක්ෂේත්‍ර පුරාවිද්‍යාව හා සම්බන්ධිත දේශීය හා අන්තර් ජාතික පනත් ප්‍රඥප්ති යනාදිය. |
| 2. කළමනාකරණය | 1. කළමනාකරණය පිළිබඳ හැඳින්වීම.<br>2. කළමනාකරුවන්ගේ කාර්යයන් හා කුසලතා.<br>3. සැලසුම් ක්‍රියාවලිය හා සංවිධාන මට්ටම් ඇති කිරීම.<br>4. සංවිධාන ව්‍යුහය.<br>5. මානව සම්පත් කළමනාකරණය.<br>6. ගැටළු නිරාකරණය.<br>7. වෙනස්වීම් කළමනාකරණය. |

සකස් කළේ :
අත්සන : ..................
නම : ..................
තනතුර: ..................
දිනය : 2017.05.29

පරීක්ෂා කළේ :
අත්සන : ..................
නම : ..................
තනතුර: ..................
දිනය : 2017/05/29

අත්සන : ..................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..................
තනතුර : ..................
දිනය : ..................
නිල මුද්‍රාව : ..................

මහාචාර්ය සෙනරත් දිසානායක
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07

පී.ඒ.එස්.එච්. පෙබරලුපේස
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත.
කොළඹ - 07.

ඇමුණුම 04

**සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම.**

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති MN-05-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන්ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තන්ගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්ථනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

(i) MN-05- II ශ්‍රේණිය

(අ) MN-05-2016 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර දහයක (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර දහය (10) සම්පූර්ණ වුව ද නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක විමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්.
MN-05- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) MN-05- I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයකට (10) වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක 10 කට වැඩියෙන් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක විමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ආ) MN-05-2016 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවය කරන නිලධාරීන්.

MN-05- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කළේ :

අත්සන : එන්.ඒ. [illegible]

නම : සහකාර අධ්‍යක්ෂ (පාලන)

තනතුර: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

දිනය : 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.

පරීක්ෂා කළේ :

අත්සන : ..................................

නම : ..................................

තනතුර: ..................................

දිනය : [illegible]

[illegible] බොරලැස්ස
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ පන්තිය)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ - 07.

අත්සන : ..................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : මහාචාර්ය සෙනරත් දිසානායක

තනතුර : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

දිනය : කොළඹ 07. [illegible]

නිල මුද්‍රාව : ..................................